# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම,**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

### (1) සාමාන්‍යාධිකාරී - (HM 2-1)

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) ඉහළම විධායක නිලධාරියා වන්නේ සාමාන්‍යාධිකාරීවරයාය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය මඟපෙන්වීම සහ පාලනය යටතේ, සංස්ථාවේ සියලුම කටයුතු මෙන්ම පරිපාලන හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වගකීම සහ වගවීම සාමාන්‍යාධිකාරීවරයා සතු වේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන බලතල, කාර්යයන් හා රාජකාරි ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ඉටු කරවීම ද සාමාන්‍යාධිකාරීවරයාගේ වගකීමකි. එසේමල රාජකාරි කටයුතුවල විශිෂ්ටත්වය ළඟා කර ගැනීම, තාක්ෂණය උත්පාදනය කිරීම හා හුවමාරු කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට නායකත්වය සහ දිරිගැන්වීම ලබා දීම ද සාමාන්‍යාධිකාරීවරයාගේ වගකීම වේ.

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත අ හෝ ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මූල්‍යය, ව්‍යාපාර කළමනාකරණය, නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව හෝ තනතුරට අදාළව වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

සහ

විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මූල්‍යය, ව්‍යාපාර කළමනාකරණය, නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ අදාළ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආයතනික සාමාජිකත්වය **(Corporate Membership)** ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 18ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිළධාරියෙකු වශයෙන් පළපුරුද්ද (ඉන් වසර 05ක් ජ්‍යෝෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද විය යුතුය)

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මූල්‍යකරණය, ව්‍යාපාර කළමනාකරණය, නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක උපාධියක්.

සහ

අදාළ ඕනෑම ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (**PhD)**

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ජ්‍යෝෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 05ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිළධාරියෙකු වශයෙන් පළපුරුද්ද

**සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ, ජ්‍යෝෂ්ඨ කළමණාකාර සේවා ගණයේ (**HM)** තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

බහුවිධ කාර්යන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාව

- වැටුප් පරිමාණය : HM 2-1 - රු. [161,140 – 12 x 4,850 = 219,340]
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 161,140 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර **2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 140,317/= කි.**)

  ඉහත වැටුප් වලට අමතරව, රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.
- වයස : අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- බඳවාගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 145ක්)

## (2) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් හා ප්‍රසම්පාදන - (HM 1-1)

**රාජකාරි:**

සැලසුම් හා ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානී ලෙස සැලසුම් සහ ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ සියලු කරුණු සඳහා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය , එනම්,

1. නිෂ්පාදන සැලසුම් කිරීම, අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය කාලසටහන්ගත කිරීම, තොග පාලනය සහ ගබඩා කළමනාකරණයට අදාළ සියලු කරුණු.
2. ටෙන්ඩර් ක්‍රියාවලිය හරහා ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, අමතර කොටස් ආදිය ආනයනය කිරීම.
3. විවෘත ණයවර ලිපි (LC ) සහ අනෙකුත් බැංකු කටයුතු, රේගු නිෂ්කාශන හැසිරවීම, භාණ්ඩ ප්‍රවාහනය, සමුද්‍ර රක්ෂණය, දේශීය මිලදී ගැනීම් ආදී කටයුතු අධීක්ෂණය කිරීම.
4. ගුණාත්මකභාවය සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම හා තොග බෙදාහැර කිරීමේ ක්‍රියාවලිය සඳහා දායකත්වය සැපයීම.
5. cGMP ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අධීක්ෂණය හා සහාය ලබා දීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතියට අනුගත වීම.
6. සාමාන්‍යාධිකාරීවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම වගකීමක් ඉටු කිරීම.

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, වාණිජ්‍යය, සැපයුම් දාම කළමනාකරණය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

සහ

අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (**Masters**) ලබා තිබීම හෝ, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (**Associate Membership)** ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, අදාළ ක්ෂේත්‍රයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්දක් තිබීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සේවා ගණයේ (**MM) I** ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (**Masters**) ලබා තිබීම හෝ**,** අදාළ විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (**Associate Membership)** ලබා තිබීම.

වැටුප් පරිමාණය : HM 1-1 - රු**.** [140,640 – 15 x 4,100 = 202,140]
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව**,** රු. 140**,**640 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර **2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 123,019/= කි**.)

ඉහත වැටුප් වලට අමතරව, රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

වයස : අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 115ක්)

## 3. පුද්ගලික ලේකම් (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත අ හෝ ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තනතුරට අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

(ආ) තනතුරට අදාළ ක්ෂේත්‍රයක ඩිප්ලෝමා හෝ උසස් ඩිප්ලෝමා සුදුසුකමක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසරක් විය යුතුය) ලබා තිබීම.

සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් තිබීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන" (MA 1-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. **65,633**/= කි.)

වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා /හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 4. පුහුණු හා සංවර්ධන නිලධාරී (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය හෝ වාණිජ්‍යය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන" (MA 1-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. **65,633**/= කි.)

වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා /හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 5. ඉංජිනේරු සහකාර (පරිගණක දෘඩාංග) (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් (පහත අ, ආ,ඇ හෝ ඈ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක විද්‍යාව හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, පරිගණක දෘඩාංග (Computer Hardware) සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 (NVQ 7) හෝ ඊට ඉහළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, පරිගණක දෘඩාංග (Computer Hardware) සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 (NVQ 6) හෝ ඊට ඉහළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් තිබීම.

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, පරිගණක දෘඩාංග (Computer Hardware) සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 හෝ ඊට ඉහළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර දහයක (10) සේවා පළපුරුද්දක් තිබීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ “කළමනාකරණ සහකාර – තාක්ෂණික” (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2026 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. **65,633**/= කි.)

වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා /හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ආන්තික ප්‍රතිලාභ:**

- පැමිණීමේ සහ කාර්ය සාධන දිරිදීමනා.
- උපයෝගී කර නොගත් වාර්ෂික සහ අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය.
- සංස්ථාව විසින් වැටුපෙන් 15%ක් හා සේවකයා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීම.
- සංස්ථාව විසින් වැටුපෙන් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වීම.
- 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛයට අනුව පාරිතෝෂිකය ගෙවනු ලැබේ.
- වෙනත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු උපදෙස්:**

- නියමිත ආකෘති පත්‍ර වල සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ විමසුම් විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය. අදාළ අයදුම් පත්‍රය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන https://www.spmc.gov.lk වෙතින් බාගත කර ගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතු අතර, ඔවුන් තෝරාගනු ලැබුවහොත්, පත්වීම ලබා ගැනීම සඳහා අයදුම්කරු නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.
- ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම පළ වී දින 10ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුරු සඳහා සහතික වල පිටපත් සමග වෙන වෙනම ලියුම් කවර වල බහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**අංක 11, සර් ජෝන් කොතලාවල මාවත**
**කඳවල වත්ත - රත්මලාන.**